www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ සසප අත් අඩංගුවට ගත් සිය සාමාජිකයා නිදහස් කරන ලෙස ඉල්ලා සිටී

## Sri Lankan SEP demands release of arrested member

සමාජවාදී සමානතා පක්ෂය (ශ්‍රී ලංකාව)
විසිනි
2008 සැප්තැම්බර් 18

ශ්‍රී ලංකාවේ සමාජවාදී සමානතා පක්ෂය (සසප), කොළඹට කිලෝමීටර් 40ක් උතුරින් පිහිටි මීගමුවේ දී පසුගිය සඳුදා පොලීසිය විසින් අත් අඩංගුවට ගනු ලැබූ පක්ෂ සාමාජික වේලුම්මයිලුම් කමල්දාසන් සහ ඔහුගේ මස්සිනා වන සන්දිරලිංගම් ඉලන්චේලියන් වහා ම හා කොන්දේසි විරහිතව නිදහස් කරන ලෙස ඉල්ලා සිටී. ඔවුන් දෙදෙනා එතැන් පටන් දින තුනක් තිස්සේ පොලිස් කූඩුවක් තුල නීති විරෝධී ලෙස රඳවා ගෙන සිටී.

මෙම අත් අඩංගුවට ගැනීම් දෙමල ජනතාව ක්‍රමානුකූලව හිරිහැරයට ලක් කිරීමේ පිලිවෙතෙහි කොටසකි. සිය ගනන් දෙමල ජනයා රටේ පවත්නා රූදුරු හදිසි නිති රෙගුලාසි යටතේ එල්ටීටීඊ සාමාජිකයන් ලෙස සැක කරමින් නඩු විභාගවලින් තොරව හිතුවක්කාරී ලෙස රඳවා තබා ගනු ලැබේ. කමල්දාසන් හා ඉලන්චේලියන් මුලින් පදිංචි වී සිටියේ යාපනයේ බැවින් ඔවුන් රඳවා ගෙන සිටින බව කියාපාන පොලීසිය, ඔවුන්ට එල්ටීටීඊය සමග සබඳතා පවතී ද යන වග සොයා ගනු පිනිස පරීක්ෂන පැවැත්විය යුතු බව අවධාරනය කරයි.

කමල්දාසන් පක්ෂයේ දිගු කාලීන සාමාජිකයකු බවට සසප ප්‍රකාශයක් දී ඇත යන්න පවා නොතකා, පොලීසිය ඔහු නිදහස් කිරීම ප්‍රතික්ෂේප කර ඇත. දැන් පැහැදිලි වන කාරනාව නම්, දින තුනකට පසුවත් ඔහු තවමත් රඳවා ගෙන තිබීම මුලුමනින් ම දේශපාලන දඩයක්කාරී ක්‍රියාවකි. ආන්ඩුවේ වර්ගවාදී යුද්ධයට සසපයේ පවත්නා විරුද්ධත්වය මෙන් ම, එල්ටීටීඊයේ ධනේශ්වර ජාතිකවාදී දේශපාලනය සමග එයට පවත්නා අතිමූලික නොඑකඟතාව ද බෙහෙවින් ප්‍රසිද්ධ ය.

තිස් හැවිරිදි කමල්දාසන් 1998 සිට සසප සාමාජිකයෙකි. ඔහු සිය පවුල සමග මීගමුව අසල කොච්චිකඩේ ප්‍රදේශයේ පලංගතුරෙයිහි ජීවත් වන අතර කලින් යාපනයේ කරෙයිනගර්හි වාසය කලේ ය. කලින් බෝට්ටු තනන කම්කරුවකු හා ධීවරයකු වූ කමල්දාසන් සහ ඔහුගේ පවුල, තවත් දහස් සංඛ්‍යාත ජනයා මෙන්, රටේ 25 අවුරුදු සිවිල් යුද්ධය හේතු කොට ගෙන කිහිප වතාවක් ම අවතැන් වී තිබේ. ඔහු වසර දෙකක් තිස්සේ ඩුබායිහි වැඩ කල අතර 2007 සැප්තැම්බරයේ දී ශ්‍රී ලංකාවට පෙරලා පැමිනියේ ය. 37 හැවිරිදි සන්දරලිංගම්, ත්‍රී-රෝද රථ රියදුරකු වන අතර පසුගිය වසර 23 තිස්සේ ඔහු මීගමුවේ ජීවත් වේ.

කමල්දාසන් හා ඉලන්චේලියන් සඳුදා පෙ.ව. 11.00ට පමන මීගමුවේ දී කොලඹ බලා යන බසයකට නගිද්දී පොලීසිය ඔවුන් වෙත ලඟා වූහ. ප්‍රශ්න කිරීම සඳහා බසයෙන් බසින ලෙස පොලිස් කන්ඩායම ඔවුන් දෙදෙනාට අන කලේ ය. දෙදෙනා ම සිය අනන්‍යතාව ලෙස තමන්ට අදාල ප්‍රදේශවල පොලිස් ස්ථානවලින් ලබා ගත් ලියාපදිංචි ලියකියවිලි ඉදිරිපත් කලහ. පොලීසිය එම ලියවිලි නොතකා "තව දුර ප්‍රශ්න කිරීම සඳහා දෙදෙනා ම මීගමුව පොලිස් ස්ථානය කරා ගෙන ගියහ.

සිය මුල් නම පමනක් දෙන රහස් ඔත්තු අංශයේ නිලධාරියකු වන හේරත්, කමල්දාසන්ගේ හා ඉලන්චේලියන්ගේ මුල් පදිංචිය පිලිබඳව ඔවුන්ගෙන් ප්‍රශ්න කොට, තවත් තොරතුරු අවශ්‍ය බව කියමින්, ඔවුන් පොලිස් කූඩුවට දමන ලෙස නියම කලේ ය. සසප මීගමුව මූලසථාන පොලිස් පරීක්ෂක (එච්ක්‍යුඅයි) සෝමසිරි ලියනගේට දුරකතනයෙන් කතා කොට අත් අඩංගුවට ගැනීමට විරෝධය පල කල අතර, එහිදී පොලිස් පරීක්ෂක කියා සිටියේ, කමල්දාසන් සසප සාමාජිකයකු නම් ඔහු නිදහස් කරන බව යි.

කෙසේ වෙතත්, සසප නියෝජිතයකු පොලිස් ස්ථානයට ගිය විට තත්වය වෙනස් වී තිබුනි. ඔවුන් දෙදෙනා කලින් යාපනයේ පදිංචිකරුවන් බව ඔත්තු සේවා නිලධාරි හේරත් එච්ක්‍යුඅයි ලියනගේට කියා තිබුනි. ඔවුන් "ත්‍රස්තවාදී ක්‍රියාවන්ට" මොන යම් ආකාරයකින් හෝ සම්බන්ධ ද යන්න සොයා බලනු පිනිස කොලඹ සහ කරෙයිනගර් ත්‍රස්ත විමර්ශන ඒකකයෙන් (ටීඅයිඩී) තොරතුරු ලබා ගැනීම අවශ්‍ය යයි එවිට කියන ලදි.

ටීඅයිඩී තොරතුරු අඟහරුවාදා උදේ වන විට ලැබෙනු ඇති බවට දුන් සහතික වීම් නොතකා, සසපට තවත් බාධාවකට මුහුන දීමට සිදු විය. අඟහරුවාදා උදේ, මීගමුව පොලීසිය කියා සිටියේ වාර්තා සවස් වන විට ලැබේ යයි බලාපොරොත්තු වන බව යි. සිය සාමාජිකයා අත් අඩංගුවට ගැනීම ගැන සසප කල නිල පැමිනිල්ලක් සටහන් කර ගැනීම ඔවුහු ප්‍රතික්ෂේප කලහ.

පක්ෂ සාමාජිකයකු ලෙස කමල්දාසන්ට එල්ටීටීඊය හෝ "ත්‍රස්තවාදය" සමග සම්බන්ධයක් තිබීමේ හැකියාවක් නැත යන සසප ප්‍රකාශය, මීගමුව පොලිස් අධිකාරි පී.කේ. විතාන කෙලින් ම ප්‍රතික්ෂේප කලේ ය. පසුදින සසප ප්‍රධාන ලේකම් විජේ ඩයස්, කමල්දාසන් සසප සාමාජිකයකු බව සහතික කරමින් හා ඔහු නිදහස් කරන ලෙස ඉල්ලා සිටිමින්, පොලීසිය වෙත ලිපියක් ෆැක්ස් කලේ ය. එහෙත් එච්ක්‍යුඅයි ලියනගේ ඔවුන් දෙදෙනා රඳවා ගැනීමේ නියෝගයක් යටතට පත් කරන බවක් ඇඟවූ නමුත් ඒ කවදාදා යන වග පැවසීම ප්‍රතික්ෂේප කලේ ය.

අඟහරුවාදා හැන්දෑවේ හෙලා දැකිය යුතු පිලිගැනීමක් කරමින්, පොලිස් නිලධාරින් කමල්දාසන්ගේ ඥාතින්ට පැවසුවේ, තමන්ට ඔවුන් දෙදෙනා නිදහස් කල නොහැක්කේ සසප මැදිහත්විම නිසා බව යි. එම මැදිහත්වීමෙන් "තත්වය නරක් වී" ඇති බව පොලීසිය කියා සිටියේ ය. වෙනත් වචනවලින් කිය තොත්, කමල්දාසන් සහ ඔහුගේ මස්සිනා දිගට ම රඳවා ගෙන සිටින්නේ, ඔවුන් එල්ටීටීඊයට හෝ "ත්‍රස්තවාදී ක්‍රියාවන්ට" සම්බන්ධ බවට මොන යම් හෝ සාක්කියක් ඇති නිසා නොව, සසප සිය සාමාජිකයා නිදහස් කරන ලෙස ඉල්ලා දෙදෙනාගේ ම ප්‍රජාතන්ත්‍ර අයිතීන් ගැන අවධාරනය කල නිසා ය.

මෙම රඳවා ගැනීම්, ජනාධිපති මහින්ද රාජපක්ෂ එල්ටීටීඊයට එරෙහි ආක්‍රමනික මෙහෙයුම් යලි අලුත් කිරීම මගින් 2002 සටන් විරාමය සිද්ධිදායක ලෙස ඉරා දැමූ 2006 මැද සිට ආන්ඩුව සහ මිලිටරිය විසින් නිර්මානය කරන ලද, විශේෂයෙන් ම දෙමල ජනයාට හා යුද්ධයේ විරුද්ධවාදීන්ට එරෙහි, ත්‍රස්ත හා දඩයම් වාතාවරනයේ කොටසකි. වතාවතක් ලෙස දෙමල ජනයා හිරිහැරයට ලක් කිරීමට අමතරව, ආරක්ෂක හමුදා සහ ඒවාට සම්බන්ධිත පැරා-මිලිටරි කන්ඩායම් පැහැර ගෙන යාම්, අතුරුදහන් වීම් සහ ඝාතන සිය ගනනක් සම්බන්ධයෙන් චෝදනාවන්ට ලක්ව තිබේ.

2006 අගෝස්තු 7 දා, යුද්ධය යලි ඇරඹීමෙන් යන්තම් සති කිහිපයකට පසුව, නැගෙනහිර පලාතේ ග්‍රාමීය නගරයක් වන මුල්ලිපොතනේ දී, සසප ආධාරකරුවකු වන සිවප්‍රකාශම් මරියදාස් සිය නිවසේ සිටිය දී වෙඩි තබා ඝාතනය කරන ලදි. 2007 මාර්තු 22 දා, සසප සාමාජික නඩරාජා විමලේස්වරන් සහ ඔහුගේ මිතුරකු වන සිවනාදන් මදිවදනන් ඔවුන්ගේ නිවාස පිහිටි කයිට්ස් දූපතට යාබද පුංගුඩුතිව් දූපතේ සිට කයිට්ස් කරා ආපසු එමින් සිටිය දී අතුරුදහන් විය. එම අවස්ථා දෙකේ දී ම, සසප විසින් සොයා ගන්නා ලද සාක්ෂ්‍ය මගින් පෙන්නුම් කෙරුනේ මිලිටරියේ හෝ පැරා-මිලිටරි කන්ඩායම්වල සම්බන්ධය යි.

පොලීසිය දැන් දිවයින පුරා සෝදිසි මෙහෙයුම් හා අනන්‍ය පත්‍ර පරීක්ෂා කිරීම් සිදු කරයි. ඔවුන් සිය ආරම්භක නේවාසික ප්‍රදේශවලින් පිටත වාසය කරන්නේ නම්, සියලු දෙමල ජනයා සිය ප්‍රදේශයේ පිහිටි පොලිස් ස්ථානවල ලියාපදිංචි විය යුතු ය. හිතුවක්කාරී ලෙස දෙමල ජනයා අත් අඩංගුවට ගෙන තමන්ට අල්ලස් ගෙවුව හොත් පමනක් ඔවුන් නිදහස් කිරීම මගින් පොලිස් නිලධාරින් කප්පම් ගැනීමේ සිද්ධීන් සම්බන්ධයෙන් මානව හිමිකම් සංවිධාන වාර්තා කර ඇත.

ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ, කොලඹට ගලා එන "දැවැන්ත ජනගලනයී" ඉහල යන ආරක්ෂක අවදානමක් මතු කරන බවට ඩේලි නිව්ස් පත්‍රයට පසුගිය සෙනසුරාදා ප්‍රකාශ කිරීම මගින්, ආරක්ෂක දැල තව දුරටත් ශක්තිමත් කිරීමක් සංඥා කරයි. යුද්ධයෙන් ඉරි තලා ගිය උතුරෙන් හා නැගෙනහිරෙන් 6,950ක ජනතාවක් කොලඹට පැමිනීම "පෙර නොවූ විරූ" දෙයක් ලෙස විස්තර කරමින්, ඔහු ප්‍රකාශ කලේ, ඔවුන්ට මෙහි සිටීමේ නීතියුක්ත හේතුවක් නැති නම් ඔවුන් "ආපසු සිය ප්‍රදේශ කරා යා" යුතු බව යි.

කමල්දාසන් සහ ඔහුගේ මස්සිනා අත් අඩංගුවට ගැනීම සමස්තයක් ලෙස කම්කරු පන්තියට තියුනු අනතුරු ඇඟවීමක් මතු කරයි. කම්කරු පන්තියේ ජීවන මට්ටම්වලට පහර එල්ල කරන ගමන්, ආන්ඩුව එල්ටීටීඊයට එරෙහි සිය ප්‍රතිගාමී යුද්ධය උත්සන්න කරන විට, එය නැගෙන මහජන වෛරයට හා විරසක භාවයට මුහුන දෙයි. විවේචන නිහඬ කිරීමේ හා විරුද්ධත්වයන් මැඩීමේ උත්සාහයක් ලෙස, එය විවෘත මර්දනයට පිවිසෙයි.

කමල්දාසන් සහ ඉලන්චේලියන් වහාම නිදහස් කරන මෙන් ඉල්ලා සිටින ලෙස, කම්කරුවන්, තරුනයන්, බුද්ධිමතුන් සහ මූලික ප්‍රජාතන්ත්‍ර අයිතීන් ආරක්ෂා කිරීමට සහයෝගය දෙන සියලු සංවිධාන වෙත සසප කැඳවුම් කර සිටී. ශ්‍රී ලංකාවේ අදාල බලධාරින් වෙත ලිපි යැවීම මගින් අපගේ උද්ඝෝෂනයට සහයෝගය දෙන ලෙස *ලෝක සමාජවාදී වෙබ් අඩවියේ* පාඨකයන්ගෙන් අපි ඉල්ලා සිටිමු.

ලිපි යැවිය යුත්තේ:

ගෝඨාභය රාජපක්ෂ,
ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය,
15/5, බාලදක්ෂ මාවත,
කොලඹ 3, ශ්‍රී ලංකාව.
ෆැක්ස්: 0094112541529

පොලිස්පති,
පොලිස් මූලස්ථානය,
කොලඹ 1, ශ්‍රී ලංකාව.

පොලිස් අධිකාරි,
පොලිස් අධිකාරි කාර්යාලය,
මීගමුව, ශ්‍රී ලංකාව.

ඔබ යවන ලිපිවල පිටපත් ශ්‍රී ලංකාවේ සමාජවාදී සමානතා පක්ෂය සහ ලෝක සමාජවාදී වෙබ් අඩවිය වෙත එවිය යුතු ය.

සමාජවාදී සමානතා පක්ෂය,
තැ.පෙ. 1270,
කොලඹ, ශ්‍රී ලංකාව.

© www.wsws.org